# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.19 පැය 0030 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/774/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - මතුගම පොලිස් වසම.**

2025.04.18 වන දින දහවල් කාලයේ මතුගම පොලිස් වසමේ දොලහේන ප්‍රදේශයේ ගෙල කපා ඝාතනය කරන ලද කාන්තා මෘත ශරීරයක් ගෙනවිත් දමා ඇති බවට මතුගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 33 ක් වූ මවරීන් සමරනායක මාවත, අඟලවත්ත ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරයේ කැපුම් තුවාල කිහිපයක් දක්නට ලැබෙන අතර ප්‍රේම සම්බන්ධතාවයක් මත ඇති වූ ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. සැකකරු හඳුනාගෙන ඇති අතර ප්‍රදේශයෙන් පලාගොස් ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මතුගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.**

2025.03.18 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ඕඩියන් හන්දිය අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - මාවනැල්ල පොලිස් වසම.**

2025.04.18 වන දින දහවල් කාලයේ මාවනැල්ල පොලිස් වසමේ මාවනැල්ල හෙම්මාතගම මාගර්යේ නාන්කුරගම ප්‍රදේශයේදී මාවනැල්ල දෙස සිට හෙම්මාතගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් සුනකයෙකුගේ ගැටී යතුරුපැදිය පෙරලී මාගර්යේ ඉදිරියට ඇදී ගොස් පදික කාන්තාවකගේ ගැටී යතුරුපැදිකරු සහ පසුපැදිකරු අසල කොන්ක්‍රිට් තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින්

බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු, පසුපැදිකරු සහ පදික කාන්තාව මාවනැල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ දෙවනගල, මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මාවනැල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - සන්දිවේලි පොලිස් වසම.

2025.03.18 වන දින සවස් කාලයේ සන්දිවේලි පොලිස් වසමේ මඩකලපුව ත්‍රිකුණාමලය ප්‍රධාන මාගර්යේ සන්දිවේලි ප්‍රදේශයේදී වාලච්චේන දෙස සිට මඩකලපුව දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි තවත් යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් යතුරුපැදි දෙකෙහි පැදිකරුවන් දෙදෙනා සහ පසු පැදිකරුවෙකු බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා සන්දිවේලි රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරුවෙකු මියගොස් ඇත. අනෙක් පැදිකරු හා පසු පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා මඩකලපුව රෝහලට මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ තැපැල් කායර්ාලය ඉදිරිපිට පාර, සන්දිවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සන්දවේලි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සන්දිවේලි පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**